Determine whether assumptions about the data, analysis methods, and mapping methods would alter the results. Also consider what artifacts of the data, analysis, and mapping processes deserve special attention.

**4. Make decisions**

Document your interpretation of the analysis results and decide how to respond. In some cases, you can take action based on your interpretation of the results. Implement a solution, correct a situation, create an opportunity, or mitigate circumstances. Often new questions arise that need to be addressed. These new questions will often lead to further analysis.

**5. Share your results- Presentation**

Identify the audience (courts, relevant committee, commission or authority) that will benefit from your findings and determine that who you wanted to influence. Then use maps, pop-ups, graphs, 3D digital models and charts that communicate your results efficiently and effectively. Share those results with others through appropriate media to provide deeper explanation and support further inquiry.

This description of the spatial problem solving approach is a simplification, in large part because problem solving isn't linear. The actual process will be much more involved. You will iterate, diagnose, and review as you gain new insights and understanding along the way, prompting you to reconsider your approach.

**Responsibility of Survey Department**

As the oldest Government Department of Sri Lanka, the Sri Lanka Survey Department (SLSD) is the National Surveying & Mapping Organization pioneering the fields such as Land Surveying and Mapping. Due to the development of IT, those fields were become more IT contributed fields, the department drive towards new direct to increase its efficiency.

So, recently established new branch, namely **Special Surveys and Quality Control (SS & QC)** plays a significant role to support the rapid collection of Geo-Data for Survey Department needs as well as Spatial Problem identification through the land related information cooperating with other interested organizations in the country ( Figures 1 to 6).

**The branch equipped with Total Stations, Digital Levels, RTK GPS instruments, UAV with relevant software and ready to deploy survey teams for any kind of rapid tasks approved by the Surveyor General.**



# ඉඩම්වලට නම් තැබූ මිනිසා

*බලයලත් මිනින්දෝරු සුනිල් කුසුම්සිරි මයා*

## තණ්හාවත් සමඟ තොවිල් නැටීම

මා මිනින්දෝරුවරයෙකු වූයේ මීට තිස් එක් වසරකට පෙරදී ය. ඒ රැකියාව මගේ හද යෞවනය විසින් සෙනෙහසින් වැළඳ ගත්තකි.

මා කුඩා කාලයේ දී දිනක් මිනින්දෝරු මහතෙක් පැමිණ අපේ මහ ගෙදර පිහිටි අපේ කඩය මැන්නේ ය. ඒ මිනින්දෝරු මහතා රතු, උස, සිහින් දේහයකින් යුතු අයෙක් විය. පසු කාලයේ ඔහුව මා විසින් හඳුනා ගනු ලැබුවේ ඩී. වීරසේකර මිනින්දෝරු මහතා ලෙස ය. ඔහු පැමිණි කලු මයිනර් කාර් රථයේ උඩ ''හුඩ් රැක්'' එකේ රතු සහ සුදු පැහැයෙන් වර්ණ ගැන්වූ මැනුම් රිටි කිහිපයක් ගැට ගසා තිබිණි. සරම් කැහිපොට ගසා ගත් කම්කරුවෝ දෙදෙනෙක් වානේ දම්වැලක් පාර දිගේ අදිමින් සිටියහ. එය සුවිශේෂ දසුනක් වූවා මිස , ආසාවක් නොවීය. නමුත් එය මගේ කුඩා අවධියේ නොමැකෙන මතකයක් වූයේ නිරායාසයෙනි. මුස්ලිම් මිනිසුන් ද විශාල ප්‍රමාණයක් ජීවත් වූ ඒ අපේ ගම, ගාල්ල නගරයට නුදුරු ගිංතොට, විදනගොඩය. එය ඇත්තට ම සුන්දර ගම්මානයකි.

මා පෙර කී කතාවට අදල නොවෙතත් මා මිනින්දෝරුවරයකු වීමද අපූරු කතාවකි. කිසිද කිසිවිටෙක නොසිතූ එය අහම්බයකි.

මගේ පළමු ක්ෂේත්‍ර පත්වීම සියඹලාණ්ඩුව ප්‍රදේශයට ය. මගේ පළමු මැනීම වූයේ සියඹලාණ්ඩුවට නුදුරු තඹලකණ්ඩිය වැව මැනීම ය. රත්න ශ්‍රී විජේසිංහයන් ''බිම්බරක් සෙනඟ ගැවසුණු චන්‍ද්‍ර සූර්යයා ඉපදුණු- ස්වර්ණ භූමියේ මනරම් මාලිගාව කෝ'' ගීතය ලියා ගුණදාස කපුගේට දුන්නේ සියඹලාණ්ඩුවේ දී ය. රත්න ශ්‍රී සියඹලාණ්ඩුවට ඉඳහිට ආයේ ඔහුගේ නංගී සියඹලාණ්ඩුවේ ගුරුවරියක ලෙස සේවය කළ නිසා ය.

ඔය ආකාරයට මම මගේ යෞවන කාලය තුළ සියඹලාණ්ඩුවේ ඉඩම් මැනීමේ යෙදී සිටියෙමි. හවසට පිඹුරු වැඩ සහ කාර්යාල කටයුතු කළේ මගේ කඳවුරේ සිට ය. මේ අතර සවස් යාමයේ එක්තරා කුඩා ළමයෙක් පාසැල් හමාර වීමෙන් පසු නිතර නිතර කඳවුරට එන්නට පුරුදු වී සිටියේ ය. ඔහු නමින් පොඩි රාළහාමි ය. පාසල් නිවාඩු කාලයේ දී ඉඳහිට මා සමඟ ඉඩම් මැනීමට ද මේ පාසැල් සිසුවා පැමිණියේ ය.

''අය්යේ, මටත් ආසයි මිනින්දෝරුවෙක් වෙන්න......මිනින්දෝරුවෙක් වෙන්න ත්‍රිකෝණමිතිය උවමනාද?''

මිනින්දෝරුකමට වහ වැටී සිටි පාසැල් ළමයා මගෙන් ඇසුවේ ය.

''ඔව්! මල්ලී....ඔයාටත් පුලුවනි මිනින්දෝරුවෙක් වෙන්න........ඒකට ත්‍රිකෝණමිතියත් උවමනායි'' මම කීවෙමි.

නමුත් මේ මල්ලී හොඳට ගණිතය ඉගෙනගත් නමුදු කිසිද මිනින්දෝරුවෙකු වූයේ නැත. ඔහු සියඹලාණ්ඩුවේ පාසැලෙන් විභාගය සමත් වී පේරාදෙණිය සරසවියේ ගණිත අංශයේ කථිකාචාර්යවරයෙකු වූවේ ය. දැන් යුරෝපා විශ්ව විද්‍යාල කිහිපයකම අභ්‍යාවකාශ විද්‍යාව පිළිබඳ ව මහාචාර්යවරයෙකු වන ඔහු අතිදක්ෂ ගණිතඥයෙක් විය. ත්‍රිකෝණමිතිය ගැන මගෙන් අසා දැන ගත් ඒ උනන්දු ළමයා ඊයේ පෙරේද දිනක මට යළිත් සියඹලාණ්ඩුවේ දී ම හමු විය. රැයක් පුරාම අල්ලාප සල්ලාපයක යෙදුණු මේ මහාචාර්යවරයා මට කීවේ ''අය්යා ඒ දවස් වල වැඩ කරන විදිය බලං

ඉඳලා.........මටත් හරිම ආසාවක් තිබුණෙ සර්වේයර් (මිනින්දෝරුවරයෙකු) කෙනෙක් වෙන්න. මතකද මම අය්යාගෙන් ත්‍රිකෝණමිතිය ගැන අහනවා.......'' ඔහු නිහතමානීව අතීතය මතක් කළේය.

ගෙවුණ කාලය තුළ රැකියාව හේතු කොට ගෙන, මම රට පුරා ඇවිද්දෙමි. අව්ව, වැස්ස, සුළඟ, දහඩිය මගේ රැකියාවේ මිතුරෝ වූහ. බත් පත කෑවේ සමහර විට ගලක් උඩ සිට ය. නැත්නම් ගහක් උඩ සිට ය. මා මේ ලියන සෑම වචනයකට ම එක කතාවක්- බැගින් ලියන්නට හැකි තරමට අත් දැකීම් ලැබුණේ ඒ අනුවය.

මා සමඟ ගමේ එකට සෙල්ලම් කළ සුදුගේ ඇස් දෙක පසුව නොපෙනී ගියේ ය. සුදු ජීවත් වූයේ අපේ ගමේ වෙල් යායට එපිට පිහිටි පොල්දූවේ ය. අපි සමඟ දවාලට සෙල්ලම් කරන සුදු රෑ බෝ වූ විට වෙල් යාය මැදින් ගෙදර යන්නේ හුළු අත්තක් දල්වා ගෙන ය. ලොව දිනූ සිත්තරාවිය ලෙසට විරුදාවලිය ලත් සිබිල් වෙත්තසිංහ මහත්මියගේ පොත්පත් වල එන සියලු චරිත අපේ ගමේ ජීවත් වූහ. ඒ සිබිල් නැන්දගේ ගමත් අපේ ගමත් ගිංතොට ම වූ නිසා ය.

''සුනිල් අය්යේ..... අපේ ඉඩම මැනලා, අය්යලා දෙන්නට බෙදල දෙන්න ඕන.....'' සුදු දවසක් මට කීවේ ය.

මම සුදුගේ ඉල්ලීම ඉටු කළෙමි. ඇස් දෙක ම නොපෙණුන ද ඉඩම බෙදන අයුරු වැලි පොළොව මත ඇඟිල්ලෙන් ඇඳ සුදු මට පෙන්වූයේ ය.

'' හතරේ පංතියෙ දි තමයි මගේ ඇස් පෙනීම අඩුවෙන්න ගත්තේ, රත්මලානේ අන්ධ විද්‍යාලයට අපේ අම්මලා මා දැම්මා නම් මට මෙහෙම වෙන්නේ නැහැ.....'' සුදු මට කීවේය.

මම තිස් අවුරුද්දක් පුරා සෑම තරාතිරමක ම මිනිසුන්ගේ ඉඩම් මැන්නෙමි. ඉඩම් මැනීම ''තණ්හාවත් එක්ක තොවිල් නැටීමක්'' ලෙසට මට වැටහුණේ මේ කාලය තුලය.

''මේ අඟලක් දෙකක් වැඩියෙන් අරගෙන මොකටද? අපි මැරෙන මිනිස්සුනේ'' තණ්හාකාරයා සෑම විට ම මිනින්දෝරුවරයාට කියන්නේ ය.

වරක් මම මායිම් ආරවුලක් විසඳීමට ඉඩමක් මැන්නෙමි. යාබද ඉඩමෙන් අල්ලා ගෙන, වැසිකිළියක් තැනූ කටකාර කාන්තාව මට ද ඉඩමට නොඑන්නට දෙන සෙයකි. ඉඩම මැන පැයකින් විතර පසු, මම නියම මායිම පොළොවේ පිහිටුයෙමි. ඇයගේ වැසිකිළිය නියම ඉඩම පැත්තට ගියේ ය. කට සැර කාන්තාවගේ කට සැර තවත් වැඩි වන්නට විය. අනෙක් ඉඩමේ අයිතිකරු කට සැර කාන්තාව වෙත පැන, කට පොඩි වෙන්නට ගැසුවේ ය. කටින් ලේ හැළුණේ ය. අනෙක් පසුපස ඉඩමේ හිමිකරු මාගේ මිතුරෙකි. මිතුරා පොලීසියේ උසස් නිලයක් දරන්නේ ය. ඇස් ඉදිරියේ දුටු මේ ජවනිකාව දැක, මගේ කනට ළං වී ඔහු ඇසුවේ ''මචං.....අපේ නැන්දම්මාටත් මේ වගේ ඉඩමක් මැනලා දෙන්න බැරිදැ?'' කියා ය.



# STOCK MANAGEMENT SYSTEM (SMS)

*Mr. S.K.Kuruppuarachchi. Supdt.of surveys (Procument & Supply)*

Stock Management system of Survey Department, in simply called as SMS is a database developed by Survey Department IT branch with the request of Procurement & Supplies Branch. It is also password protected database and will give you facility to handling stores matters, easier, faster, reduce hard copy paper work and cumbersome branch process. It is very much helpful user to verify the balance remaining stores before applying items, any time user can check actually chargeable stores, facilitate to transaction and annual verification also.

According to my experience as a S S(P&S)branch, most of the department users call me and ask various questions about SMS operations daily. So Herewith I expect to explain you, how to operate this database without any interruption.

**How to create an account**

Log on Survey Department website (www.survey.gov.lk). Next, go to staff access and then go to SMS icon and click it. Then, SMS login panel will appear on your monitor. When you appear the login panel at first , click sign up here.




When you see sign up menu, fill it fields carefully. The User name must be your stores ledger number (OR identification number) and Password is your choice. (It is Important to remember those). Then click sign up button.




After administrator accept your request, you can sign up SMS by using your user name and password.

## SMS main menu features

Using this database you can easily apply govt.stores, find out your ledger balance, download annual verification form, check store balance of main stores and can get details of store transactions. (i.e.issuing,returns & condemning)etc.




## How to apply stores items using SMS online service

Use the button REQUEST (S56) in SMS panel. There are three function keys under this system.

### S56-FORM

This button is use to apply government stores from SGO (P&S) branch. Fill it carefully and select items using pull down menu buttons under each group.(i.e. Do not try to enter item names using key board). Finally press submit button.

### CERTIFIED-S56

If Govt.surveyor apply the item, that request will appear in SS`s computer under surveyor`s name. Likewise if SS in Div.S.O. apply some item, that request will appear in Snr.SS`s computer under Div.S.O.name and any branch in SGO is as same.
It is compulsory that the supervising officer must click on certify OR not certify.

### PRINT- S56

After the supervising officer`s certification, that request will appear on SGO(P&S) branch administrator`s computer. Then the administrator will approve that request, considering store balance and senior officer’s prior approval for issuing.
After having administrator`s approval, the applicant can get hard copy printout using this button. It is necessary to print three copies of each S56 and signatures of applicant, immediate supervising officer with official seal. If the applicant won`t present to collect store items, certified specimen signature of receiver is very essential.

### Important

It is very important, when the Govt.surveyor OR store chargeable officer of each field office and SGO branch, will transferred to new place please update HURIMS accordingly.

### LEDGER BALANCE

Using this button every user can check chargeable store details. It is facilitate to check items by date range OR period also. Hence ledger holder can get an idea about chargeable stores in any time. Ledger balance automatically update when issuing, returning or condemning any store item.

### ITEM CODES

When you are going to apply any store item you may know appropriate new item codes. This button will help you to find item codes of each category. Simply select category using pull down arrow and press find button. If you need to get hard copy print, press Export to Excel button.

VERIFY S56/S58

Using this button you can easily check the issuing, returning, transferring and condemning details of government stores according to the period you need. Simply select the duration and press find button. When you need to get hard copy print, press Export to Excel button.
In this case you have an opportunity to get up-to-date details of issuing, returning, transferring and condemning of stores, without receiving S56, S58 forms. According to this information you can update your store ledger too.

MAIN STORE

This button helps you to find out store balance in each item category in SGO stores. Simply select category name and press find button, then balance quantity of each item will appear. This will help you to get an idea, before applying any item.

ANNUAL VERIFICATION

Using this button you can get a printout of Annual Verification Form (AVR) including chargeable items with quantity. At the end of the year (i.e. end of December) download the AVR through SMS and fill the ledger balance column, physical balance column at the time of verification. Please prepare three copies accordingly. In addition, if any ledger holder chargeable to Survey instruments (i.e. GNSS receivers, Total stations, Levels etc. ) need to down load instrument accessory list and fill those and attached to AVR Form.

SEARCH

Under this function following facilities are available in SMS.

- ❖Status of your request,
- ❖find any ledger number,
- ❖ details of issued items in office level,
- ❖ assets list and SIGAS report etc.

At present basically this database facilitate to user to apply store items online, AVR form in digital and to get some information only. But our aim is to upgrade this SMS database to provide facility to return, condemning and transferring store items using online service in future.



# SRI LANKA NSDI IS UNDER IMPLEMENTATION FOR PROVIDING NATIONWIDE ONLINE ACCESS TO GEO-SPATIAL INFORMATION

*Mr. K.W.A. Wijayawardana. Senior Deputy Surveyor General (Research & Development)*

## 1.0 Introduction to NSDI:

National Spatial data infrastructure of a country is the centralized national geospatial data repository built on technology and policies with high collaboration of all data stakeholders in order to overcome key issues in geoinformation industry and for empowering some key tasks of the country. As such NSDI is a framework of policies, standards, procedures data and technology to support effective coordination and sharing of spatial information among government organizations, private sector researches and public for evidence base decision making.

Following are the widely accepted definitions for NSDI:

**Definition I:**

"The technology, policies, standards, and human resources necessary to acquire, process, store, distribute, and improve utilization of geospatial data." The NSDI has become a critical vehicle for facilitating seamless data development, information sharing, and collaborative decision making across multiple sectors of the economy.

**Definition II:**

A **spatial data infrastructure** (SDI) is a data infrastructure implementing framework of geographic data, metadata, users and tools that are interactively connected in order to use spatial data in an efficient and flexible way.

## 1.1 Why SL NSDI is necessary for Sri Lanka

**There are two main reasons for which LS NSDI is to be established. Such reasons are:**

1. Imposing best practice protocols across the industry for streamlining geoinformation activities in the industry
2. Providing web based, fast online access for sharing and integration of geo spatial information produced by every data producers, in order to empower the key tasks of the government while opening avenues for the society as well

**Reason 1 in details:**

Best practice protocols should have to be imposed across all government organizations that produce and maintain geo spatial information, in order to addressing mal practices of the industry. There is no any policy for collaboratively perform geoinformation business of government organizations in an efficient, cost effective and consistent manner.

Some malpractices identified in the industry are:

- Duplicated data acquisitions
- Duplicated work processes

- Inconsistent geo spatial data across data producers
- Nonexistence of central data warehouse
- Nonexistence of metadata
- Nonexistence of standards
- Nonexistence of Geo_IT infrastructure.
- Lack of policies
- Nonexistence of Regulatory mechanism for the industry

If these issues are overcome, it create opportunity for best practicing which make many chances to save millions of rupees per month in the industry.

**Reason 2 in details:**

The second reason for which establishing a NSDI is for empowering the execution of key tasks of the government that need integrated geospatial information with fast on line access, where evidence based decision makings are frequently involved. Such key tasks of the government in relation to sustainable developments goals are:

- Economic Growth
- Poverty Alleviation
- Socially Inclusive Development
- Protection of the Environment
- Water Resource Management:
- Disaster Response
- Industry development
- Agricultural productivity

**How it save money:**

Once malpractices of the industry is eliminated by imposing best practice protocols will make environment to prohibit money wasting any more. Nevertheless making environment for interoperable data sharing through online mechanism for integration of data that widely needed will open up new horizon to execute strategic goals of the government in easy, fast and effective manner.

### 1.2 SL NSDI under implementation

In order to establish such a framework (NSDI) for Sri Lanka , many studies and some foreign consultations have been carried out during last two decades (from 1994 to 2016) period. Many of those studies were carried out under the paternity of land ministry. Based upon the recommendations of such studies first ever implementation called 'phase1' of SL NSDI along with draft policy were realized by ICTA on behalf of the geoinformation community of the country in year 2018.

### 2.0 The First ever implementation of 'Geo portal' of SL NSDI by ICTA in year 2018

Many thanks should go to ICTA for this first ever implementation of a prototype of the central component of SL NSDI; the web based national geospatial data repository or the Web map portal in year 2018. ICTA undertook this implementation in year 2014 based upon previous studies followed with a new foreign consultancy in year 2016, by

virtue of a cabinet approval. ICTA got developed a prototype geo portal of SL NSDI through Indian company called Avineon .

### 2.1 Current situation and further role of ICTA

This company Avineon succeeded the development task as per the TOR at end of year 2018 and then terminated the contract even after continuation of one year maintence until end of year 2019. The Geo portal has been built complying with ISO standards, by maintaining the scalability for further enhancements to get realized a comprehensive level in future. There are about 105 data layers loaded in to the Geo portal created , belongs to more than 30 government organizations. SL NSDI is alive through. Policy and the governance setup has to be realized eventually.

### 2.2 Three components of SL NSDI :

Geoportal or central data repository is considered as the central component of SL NSDI. It is essentially underpinned by two other main components; the policy and governance set up. Following diagram shows the component of the SL NSDI.



2.3 Users can access to SL NSDI through https://nsdi.gov.lk/

**Once you accessed to the web site of the SLNSDI you can find 'Geoportal' and 'metadata ' options in it.**




**Once selected the 'Geo portal' option, one can see the map viewer of SL NSDI like below.**




Users can display 125 data layers, metadata of those layers, and five applications developed.

There is an application developed for adding 'Geo locations of SD staff' as well, in order to put the home locations.

This application can be accessed via NSDI website.




**Click 'Service' menu of the main menu and then 'Geo Location of SD staff' in the drop down. Follow the simple help provided to proceed the application.**



# GEOMETRIC ACCURACY VERIFICATION OF SPATIAL DATA

**Mr. Kapila Weerathunga, Senior Superintendent of Surveys (NSDI)**

Survey Department maintained topographic data sets in different scales such as 5K, 10K and 50K followed with continuous updating with respect to pre-defined update frequencies.. These datasets are updated using different sources. In early stages printed maps, stereo aerial photos & ground surveys techniques have been used for creating these data sets. Currently more accurate data sources and methods are deployed. LidAR ortho images, high resolution satellite images both stereo and mono are used

Survey department, as the leader in the geoinformation industry bears the mandate to declare the quality of the accuracy of fundamental data layers it produces. Positional accuracy, attribute accuracy and thematic accuracy are the vitally important elements of said data quality.

Nevertheless it is the responsibility of the SD to declare the positional accuracy as a key element of metadata maintained and issued to users along with data. Unfortunately there is no any written document published yet in this regard. Therefore effort was initiated to determine positional accuracy of transport layer of 10k Topographic data set, with respect to the accuracy of transport layer of Cadastral parcel data set. Road junctions were identified as key object in this exercise of the data set to be compered.

Selecting Cadastral data as higher accuracy dataset for this study is much suitable. Because Cadastral data is available island wide & feature accuracy of data is around 0.15 meters. That error is not significant, with comparing error of the eye estimation of the operator when drawing the center line along the road in image for the creation of Transportation Layer.

This effort is to fulfill this requirement to some extent. This study tries to identify the magnitude of positional accuracy of the Transportation data layer in Topographic data sets, produced by Survey Dept., updated from different sources.

In this process I followed the National Standards for Spatial Data Accuracy (NSSDA) & its recommendation publish by Federal Geographic Data Committee

Here created a Testing methodology for sample data collection & calculation to estimate the Horizontal Accuracy of Transportation Layer of 10K Topographic datasets, with respect to Cadaster data ground positions of higher accuracy.

Transportation Layer of 10K Topographic Dataset is tested based on Cadaster data. 10K Transportation layer Accuracy directly depending on the quality of updated data source & also depends on the experience of the operator & his image classification ability. Drawing centerline along the road of the image by operator’s eye estimation is much effected to the accuracy of the dataset.

## UPDATED SOURCES FOR TOPOGRAPHIC DATASETS

10K topographic data set can be grouped to five zones depending upon the source and method of update/creation deployed in data creation or updating. The horizontal positional accuracy of 10K Topographic dataset is varied from zone to zone. Following are the five zones considered in this approach.

1 Zone 1- Data source is Printed Maps or manusctripts

2. Zone 2 - Data source stereo Aerial photos and stereo plotting.

3. Zone 3- Data source Digital Aerial color Photographs(Northern Mapping) - Stereo plotting

4. Zone 4 – Data source Satellite images on screen digitizing including SIRM Data Area

5. Zone 5- Data source Lidar semi ortho images- 0.3 m & 0.5 m resolution

## TESTING OF POSITIONAL ACCURACY

Horizontal accuracy tested by comparing the planimetric coordinates of well-defined points in the Topograpic dataset with coordinates of the same points from an independent source of higher accuracy.

Tile wise selection is followed when selecting samples. Road centre lines were generated for the area falling on selected tiles and generated centerline of the Roads in cadastral datasets in ArcGIS environment. These Road center lines overlay on 10K transportation layer. Road junctions & sharp Bends along the road were most suitable as checking pts. According to the NSSDA recommendation at least 20 checking points were taken for a single sample.

Two set of coordinate from two sources are extracted from attribute Tables & export them to XL file in order to calculate coordinate difference of the same Point. Root Mean Square Error (RMSE) is the square root of the average of the set of squared differences, between dataset coordinate and coordinate values from an independent source of higher accuracy for identical points.

Using coordinate differences ($\Delta$ x , $\Delta$ y ) of the same point were calculated using the following formula and computed the result of $\sigma x, \sigma y$ & Positional Accuracy of Points as well.

$$\sigma x = \pm \sqrt{\sum_{i=0}^{n} \Delta x^2/n}$$

$$\sigma y = \pm \sqrt{\sum_{i=0}^{n} \Delta y^2/n}$$

Positional Accuracy of Point $=\sqrt{\Delta x^2 + \Delta y^2}$

## Normal Distribution Testing

$\chi 2$ testing method was used in order to check the fitness of error with Normal distribution. Original hypothesis $H_o$ : $E(x) = E_o(x)$ , obey normal distribution; standby hypothesis $H_1$ : $E(x) \neq E_o(x)$ , don't obey normal distribution, and ($E_o(x)$ obey normal distribution. The calculated value of Chi-Square goodness of fit test is compared with the table value. If the calculated value of Chi-Square goodness of fit test is greater than the table value, we will reject the null hypothesis.

Coordinate error of X and Y direction to n locations, do some statistics to frequency in ( k i ,..., 3,2,1= )of error and calculate average and variance of coordinate error. If $H_o$ is right, according to every Location make statistic parameter $\chi 2$ as follows.

$$\chi 2 = \sum \frac{(O_i \ -E_i}{E_i} \ )$$

Accuracy is reported in ground distances at the 95% confidence level. It means that 95% of the positions in the dataset will have an error with respect to true ground position that is equal to or smaller than the reported accuracy value. Samples of each Tile tested using $\chi 2$ test with 95% confidence limits.
The Summary of Calculation & result of $\sigma x$ , $\sigma y$ & observed $\chi 2$ value for each Tile are shown in Annex1

**Result analysis**

**Estimated accuracy of 10K Transportation layer in different zones (updated Sources)**

| No. | 10K Tile Updated Sources | No of Tiles Tested | No of Tiles Rejected | No of Checking Pts. | $\sigma x$ (m) | $\sigma y$ (m) | Posi-tional Error |
|---|---|---|---|---|---|---|---|
| 1 | B/W Aerial Photographs 1/20,000 | 7 | 1 | 148 | 2.2 | 2.4 | 3.1 |
| 2 | Lidar | 23 | 2 | 519 | 0.9 | 0.9 | 1.2 |
| 3 | Digital Color A/P | 6 | 1 | 120 | 1.2 | 1.5 | 1.7 |
| 4 | Satallite Image | 5 | 1 | 105 | 4.6 | 7.0 | 8.2 |
| 5 | Printed Map | 7 | 7 | ~~124~~ | ~~5.3~~ | ~~5.4~~ | ~~6.8~~ |
| | **Total** | **48** | **12** | **1016** | | | |

**Table 1**

**Concluding Remarks**

Tile based samples were selected in this study. Statistical test satisfied for 36 tiles out of 48. Samples taken from the tiles, updated using a printed map source were rejected. Analyzing the result of rejected 7 samples Shows, these data are not concentrated to resulted Mean. That could happen due to the influence of unknown systematic errors in cartographic operations such as the generalization process. So it is necessary to go for detail study to estimate this parameter.

**Results show the Accuracies of 10K topographic datasets updated using different updated sources in Table 1. Resulted relevant accuracies in table 1, can be used as indicators for the accuracy of any 10K Topo tiles, updated using different sources (Used as indicators for the Zones above mentioned under updated Sources)**

Row data used this study is available in NSDI unit. So this analysis can be further extended by using these datasets by anyone interested to get the more confident result.

**References-**


- Geospatial Positioning Accuracy Standards- Federal Geographic Data Committee
- Spatial Positioning Accuracy Analyzing and Testing-Zeng Yanwei
- Testing of Spatial Accuracy of GIS Data-RJ Zimmers.LS
- Theory and methods for Handling Errors in Spatial Data-SHI-Wen Zhong


ALL LIFE IS AN EXPERIMENT. THE MORE EXPERIMENTS YOU MAKE THE BETTER

# මැනුම් හා සිතියම්කරණයේ තිස් තුන් වසරක අත්දැකීම්
## (තෙවන කොටස)

එස්. කේ. විජයසිංහ මයා - විශ්‍රාමික අතිරේක සර්වේයර් ජනරාල්

### 3. මැනුම් විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

“ඊරු වැව” ක්ෂේත්‍ර පුහුණුව මාස හයකින් අවසන් කර දියතලාව මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනයේ මැනුම් විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා කැඳවන ලද අතර ඒ සඳහා කණ්ඩායම් දෙකක් එක්ව සිටියහ. ඒ අප සහ අපට කලින් බැඳුනු පරිවාස කණ්ඩායමය. අප කණ්ඩායම් දෙක බඳවා ගැනීමේ කාල වකවානු දෙකෙහි වෙනස මාස 6 ක්වූ අතර අප කණ්ඩායමේ ක්ෂේත්‍ර පුහුණුව කොටස් දෙකකට කඩා මාස 6 ක මුල් ක්ෂේත්‍ර පුහුණුවෙන් පසුව එක කණ්ඩායමක් ලෙස උසස් ඩිප්ලෝමා පාඨමාලාවට යොමුකරවන ලදී. එම කණ්ඩායම් දෙක වෙන්කර හැඳින්වීම සඳහා HDC 11 සහ HDC12 (Higher Diploma Course) ලෙස කණ්ඩායම් නම් කරන ලද අතර මුළු සංඛ්‍යාව 16 ක් විය. මෙය පරිගණක භාවිතයට පැමිණි මුල්ම යුගය වූ බැවින් පරිගණක මඟින් කටයුතු කිරීමට සියළුම දෙනා විශාල උනන්දුවක් ගන්නා ලදී. මුලදීම ලැබුනේ සාක්කු පරිගණකයකි. එහි කුඩා වැඩසටහන් සකස් කර ගබඩාකරගෙන ගණක කටයුතු කළ හැකිව තිබිණ. පසුව Desktop වර්ගයට අයත් Tandy නමින් හැඳින්වූ එක් පරිගණකයක් ලැබුනු අතර මුළු ආයතනයටම ඇත්තේ එකම එකක් බැවින් එමඟින් සැම දෙනාගේම පරිගණක පුහුණු අවශ්‍යතා සපුරාගත යුතුවූ බැවින් එක් අයෙකුට වරකට ලැබුනේ පැය දෙකක කාලයකි. පැය 24 ම පරිගණකය ක්‍රියාත්මක කළ අතර එක් පැය දෙකක කාලයකින් පසුව නැවත කාලය ලැබුනේ 16 දෙනාම පැය දෙක බැගින් පරිගණකය පාවිච්චි කිරීමෙන් පසුවය. ඒ අනුව සමහර දිනවල එම අවස්ථාව ලැබෙන විට රාත්‍රී 12, පසුදින උදෑසන 2, 4, 6 ආදී වශයෙන් වූ අතර දියතලාව වැනි ශීතාධික පරිසරයක නින්දෙන් ඇහැරී තමාට නියමිත වෙලාවට එම අවස්ථාව ලබාගැනීමට උදාසීන වූවෙකුගේ අවස්ථාව ලබාගැනීමට බොහෝ අය ඉදිරිපත් විය.

### 3.1 ප්‍රායෝගික පැවරුම

උසස් ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම සඳහා ප්‍රායෝගික පැවරුමක් ඉටුකළ යුතුවිය. එය තනිවම කරන්නක් නොව කණ්ඩායමම විසින් ඉටුකළයුතු කාර්යයකි. අප කණ්ඩායම් දෙකට පැවරුනේ ඒ වනවිට විනාශවී තිබූ, එසේත් නැතිනම් ප්‍රයෝජනයට ගත නොහැකිව තිබූ කොළඹ අවට ත්‍රිකෝණමිතික ස්ථාන ජාලය ප්‍රතිස්ථාපනය කිරීමය. සාමාන්‍යයෙන් ත්‍රිකෝණමිතික ස්ථාන පිහිටා තිබෙන්නේ උස් ස්ථාන වලය. ඒ එම ස්ථාන කිහිපයක් හෝ එකිනෙකට දර්ශනය (intervisible) වියයුතු බැවිනි. ජී.පී.එස් තාක්ෂණය නොතිබූ එකල පාලන ලක්ෂ්‍ය සඳහා ත්‍රිකෝණමිතික ස්ථාන අත්‍යවශ්‍ය විය. සාමාන්‍යයෙන් මෙම ස්ථාන පිහිටවූයේ කඳු මුදුන් වල වුවත් කොළඹ ප්‍රදේශයේ කඳු නොමැති බැවින් ඒ සඳහා යොදාගෙන තිබුනේ උසට සාදා ඇති කුළුනුය. උදාහරණ ලෙස කොළඹ කොටුවේ ඔරලෝසු කණුව, කඳවල සහ හල්ගස්තොට කුළුණු හැඳින්විය හැක. මෙවැනිම කුළුනු තවත් තැනිතලා බිමක් වන දිවයිනේ උතුරු ප්‍රදේශයේද දැකගත හැක.

කොළඹ ප්‍රදේශයේ පිහිටුවා තිබූ මෙවැනි ත්‍රිකෝණමිතික ස්ථාන, පසුකලෙක ඉදිකරන ලද උස් ගොඩනැඟිලි හේතුවෙන් එකිනෙකට නොපෙනෙන පරිදි ආවරණය වී ඇති බැවින් ප්‍රයෝජනයට ගත නොහැකිවී ඇත. ඒ අනුව අපගේ පැවරුම වූයේ ත්‍රිකෝණමිතික ස්ථාන සඳහා සුදුසු නව තැන් සොයා ඒවායේ එකිනෙක අතර කෝණ සහ දිගවල් නිරීක්ෂණය කිරීම හා ඒවා ඒ වනවිට ප්‍රයෝජනයට ගතහැකිව තිබූ අනෙකුත් ත්‍රිකෝණමිතික ස්ථාන හා සම්බන්ධ කර ඛණ්ඩාංක ගණනය කිරීමයි.

කොළඹ ප්‍රදේශයේ නව ත්‍රිකෝණමිතික ස්ථාන සඳහා සුදුසු තැන් සෝදිසිකර බැලීම (reconnaissance) සඳහා අප කණ්ඩායමෙන් තෝරාගත් 8 දෙනෙකුගෙන් සමන්විත කුඩා කණ්ඩායමට පැවරුණු අතර සතියක පමණ කාලයකදී දරණ ලද බලවත් උත්සාහයකින් පසුව ඒ සඳහා සුදුසු නවාතැන් සොයාගැනීමට හැකිවිය. දහවල් කාලයේදී ඉතා ප්‍රබල දුරේක්ෂයකින් පවා එකිනෙකට නොපෙනෙන තැන් අතර එකිනෙකට පෙනීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා ඉතා සරල එහෙත් ප්‍රබල ක්‍රමවේදයක් යොදාගනු ලැබීය. ඒ තල දර්පණයක් (mirror) යොදා ගැනීමෙනි. තල දර්පණය මඟින් හිරු එළිය පරාවර්තනය කර එම පරාවර්තිත ආලෝකය යම් තැනකට දර්ශණය වීම එම ස්ථාන දෙක අතර ඇති එකිනෙකට පෙනීමේ හැකියාව තහවුරු කරන්නකි. අද මෙන් ජංගම දුරකථන හෝ වෙනත් සන්නිවේදන පහසුකම් නොමැති එකල, කලින් කථිකා කරගත් වේලාවලදී, දෙපැත්තේ සිට දර්පණ මඟින් හිරුඑළිය පරාවර්තනය කරන ලදී. එහිදී ස්ථාන දෙක දර්ශනය වන හෝ නොවන බව තහවුරු කරගත හැක්කේ කණ්ඩායම් දෙක එකිනෙක මුණගැසුණු අවස්ථාවේදී පමණි.

### 3.2 ජීවිතයේ මාරකයක්

එවැනි එක් නව තෝරාගැනීමක් වූයේ රාගම තේවත්ත බැසිලිකා දේවස්ථානයේ ගෝලාකාර මුදුනේ පිහිටි තැනිතලා රවුමේ යම්තමට ඉඩකඩ ඇති ස්ථානයකි. මෙවැනි කටයුත්තකදී කෝණ මැනීම සිදු කළ හැක්කේ රාත්‍රී කාලයේදී පමණි. ඒ එම ස්ථාන එකිනෙක අතර ඇති අධික දුර අනුව දවල් කාලයේදී එකිනෙකට නොපෙනෙන බැවිණි. රාත්‍රී කාලයේදී මෙම ස්ථාන විදුලි බලය මඟින් හෝ පෙට්‍රල් ලාම්පු මඟින් අධික ලෙස ආලෝකමත් කිරීම මඟින් එකිනෙකට පෙනෙන පරිදි සකස්කර ගතහැක.

**රාගම තේවත්ත බැසිලිකා දේවස්ථානය**



**WILD T3 විකෝණමානය**



පළමුවන ගණයේ ත්‍රිකෝණමිතික ජාලයක් (1st order Triangulation Network) සකස් කිරීම සඳහා කරනු ලබන නිරීක්ෂණ වලදී එක් ස්ථානයක සිට කරනු ලබන මෙවැනි කෝණ නිරීක්ෂණයන් 16 zero ක්‍රමයට කළ යුතු වන අතර ඒ සඳහා කාලගුණය හොඳින් පැවතුනහොත් සම්පූර්ණ රාත්‍රී කාලයක්ම ගතවේ. මෙම නිරීක්ෂණ සඳහා එකල යොදාගනු ලැබුවේ WILD T3 නමින් හැඳින්වූ විකලා 0.1 කට පාඨාංකය කියවිය හැකි එකල තිබූ අතිශය නිරවද්‍ය විකෝණමානයකි. අද මෙන් ආංකිත විකෝණමාන නොතිබූ එම අවධියේ පාඨාංක කියවීම අතිශය වෙහෙසකර කටයුත්තක් විය.

මෙම පැවරුමේ කටයුතු සංවිධානය කිරීමේදී අප 16 දෙනා කණ්ඩායම් 8 කට බෙදුනු අතර එක් කණ්ඩායමකට දෙදෙනෙකු ඇතුලත් විය. එක් අයෙකු දුරේක්ශය මඟින් කරනු ලබන නිරීක්ෂණ අනෙකා විසින් පොතෙහි සටහන් කරනු ලබයි. නිරීක්ෂක වෙහෙසට පත්වූ විට දෙදෙනාගේ රාජකාරිය හුවමාරු කරගනී.

එදින අප දෙදෙනා ඉක්මනින්ම රාත්‍රී ආහාරය ගෙන උපකරණ සහ වෙනත් අවශ්‍ය අඩුවැඩියද රැගෙන කම්කරුවන්ද සමඟ තේවත්ත බැසිලිකා දේවස්ථානයේ මුදුනේ පිහිටුවා ඇති ත්‍රිකෝණමිතික ස්ථානය වෙත ගමන් කළෙමු. එම ස්ථානයට ලඟාවීමට එහි සවිකර ඇති යකඩ ඉණිමඟක අඩි 100 ක පමණ දුරක් සිරස් අතට ගොස් තවත් අඩි 100 ක පමණ දුරක් වක්‍රව සහ තිරස්වද ගමන් කළ යුතුවේ. ඉණිමඟක සිරස්ව ගමන් කිරීමට වඩා, වක්‍රව සහ තිරස්ව ගමන් කිරීම ඉතාම දුෂ්කර කාර්යයකි. රාත්‍රියේ ඉතා ප්‍රවේශමින් ටෝච් එළියෙන් අත් දෙක සහ කකුල් දෙක සමබරව තබාගෙන බඩගාගෙන මෙන් ගොස් නිරීක්ෂණ කටයුතු ආරම්භ කළෙමු. විකෝණමානය සවිකර ඇති ත්‍රිපාදය වටා නිතර නිතර ගමන් කළයුතු වුවත් එක් පැත්තක තිබූ ඉඩකඩ ඉතා සීමාසහිතය. සුළු ප්‍රමාද දෝෂයකින් අඩි සිය ගණනක ප්‍රපාතයකට වැටෙනු නොඅනුමානය.

අප නිරීක්ෂණ කටයුතු කරමින් සිටින අතරතුර, පාන්දර දෙකට පමණ ධාරානිපාත වර්ෂාවක් කඩා වැටුනි. නිරීක්ෂණ කටයුතු නවත්වා උපකරණ ආරක්ෂිතව තැන්පත් කරන ලද අතර අප ගෙනැවිත් තිබූ කුඩ වලට ආවරණය විය. තවත් ටික වෙලාවකින් එය ගිගුරුම් සහිත වර්ෂාවක් බවට පත්විය. වැස්ස තුරල්වන බවක් පෙනෙන තෙක් මානයක නොවූ අතර ගිගිරුම් හඬද ක්‍රමයෙන් වැඩිවිය. වැස්ස අවසන් වනතුරු ඉණිමඟෙන් බැසීමද කළ නොහැක. වැස්සේම බැසීමට උත්සාහ කර යම් හෙයකින් ලිස්සාගිය හොත් මරණය ඒකාන්තය. ඊටත් අමතරව එය යකඩ ඉණිමඟක් වූ බැවින් අකුණු ගැසීමේ අවදානමක්ද විය. තවත් මඳ වෙලාවකින් අප ආසන්නයේම සවිකර ඇති අකුණු සන්නායකින් ගිණිබෝල විහිදෙන්නට පටන්ගති. තවත් මෙතැන රැඳී සිටියහොත් මරණය ඒකාන්තය. ඒ අනුව අවදානමක් ගෙන පහලට බැසීමට තීරණය කළෙමු. භාණ්ඩ රැගෙන යාමේ අවශ්‍යතාවයක් නොවූ අතර ඊට වඩා දෑත් නිදහස්ව තිබීම ඉතා වැදගත් විය. සියළු දෙනා එකවර බැසීමද අනතුරු දායකය. ඒ, යම් හෙයකින් උඩින් සිටින අයෙකුගේ පය ලිස්සුවහොත් පහළ සිටින අයද අනතුරට ලක්වන බැවිනි. කෙසේ හෝ අවසානයේදී සියළුම දෙනා නිරුපද්‍රිතව පහළට බැසගැනීමට සමත් විය. එම සිද්ධිය මතකයට නැඟෙන විට අදටත් රෝම කූප ලොමු ඩැහැ ගැන්වේ.

### 3.3 ප්‍රායෝගික පැවරුමේ රසවත් සිදුවීමක්

නව ත්‍රිකෝණමිතික ස්ථාන සඳහා අපගේ තවත් තෝරාගැනීමක් වූයේ මොරටුව විශ්ව විද්‍යාලයේ මහල් 4 කින් යුත් එවකට නව ගොඩනැඟිල්ලේ වහලයටත් උඩින් ඉදිකර ඇති කාමරයක කොන්ක්‍රීට් වහලයයි. අපගේ නවාතැන වූයේ විශ්ව විද්‍යාලයේ ක්‍රීඩා මණ්ඩපයයි. එදින අප දෙදෙනා දහවල් කාලයේදී අනෙකුත් ත්‍රිකෝණමිතික ස්ථාන කිහිපයකට ඇති දුර, විද්‍යුත් දුර මැනීමේ (Electromagnetic Distance Measuring) උපකරණයක් මඟින් මැන, වෙනත් ත්‍රිකෝණමිතික ස්ථාන කිහිපයකින් මොරටුව විශ්ව විද්‍යාලයේ ත්‍රිකෝණමිතික ස්ථානයට කෝණ මැනීමට රාත්‍රියේ නියමිත බැවින් ඒ සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ ත්‍රිකෝණමිතික ස්ථානය ආලෝකමත් කිරීම කළ යුතුව තිබුණි. අනෙකුත් ත්‍රිකෝණමිතික ස්ථාන එකකින් හෝ කිහිපයකින් මොරටුව විශ්ව විද්‍යාලයේ ත්‍රිකෝණමිතික ස්ථානය එක එල්ලේ නොපෙනෙන බැවින් මෙම ත්‍රිකෝණමිතික ස්ථානය ආලෝකමත් කරන ලද්දේ විදුලි බලයෙන් ක්‍රියාකරන බීකනයක් මගිනි. ත්‍රිකෝණමිතික ස්ථානයට අඩි 30 ක් පමණ උසකින් පිහිටුවන ලද අට්ටාලයක් මත මෙම බීකනය සිරස්ව සවිකිරීම ඉතා සීරු මාරුවෙන් කළ යුත්තකි.

පළමුව ත්‍රිකෝණමිතික ස්ථානය මත විකෝණමානයක් සවිකර එතැන් සිට අංශක 90 පරතරයකින් පිහිටි විකෝණමානයක් සවිකළ හැකි ස්ථාන දෙකක් සලකුණු කර එම ස්ථාන දෙකෙහි එකවර විකෝණමාන දෙකක් සවිකර, ත්‍රිකෝණමිතික ස්ථානය උඩ සවිකර ඇති බීකනය සහිත අට්ටාලය පැත්තකට ඇලවීමෙන් හෝ බිමට වැටීමෙන් වැලැක්වීමට උඩින් ලණු තුනකින් සම්බන්ධ කර ඒවා පහත ස්ථාන තුනක ගැට ගසා පෙරකී විකෝණමාන දෙකින්ම එකවර නිරීක්ෂණය කිරීමේදී, සිරස්ව බීකනය පිහිටන පරිදි ලණු වලින් සීරුමාරු කර, ලණු

තුන පහත ස්ථාන වල දැඩිව ගැට ගැසීමෙන් අට්ටාලය සහ බීකනය ත්‍රිකෝණමිතික ස්ථානය මත සිරස්ව සවිකරනු ලැබේ. අප දෙදෙනා ඉමහත් පරිශ්‍රමයකින් පසුව පැයක පමණ කාලයක් ගතකර අඳුර වැටීමට පෙර විදුලි බීකනය සහිත අට්ටාලය ත්‍රිකෝණමිතික ස්ථානයට උඩින් සිරස්ව සවිකර අවසන් කරන ලදී. පසුව නවාතැනට ගොස් දිය නා පිරිසිදුවී එදින රාත්‍රී කාලය විවේක සුවයෙන් ගතකළ හැකි බැවින් මොරටුව විශ්ව විද්‍යාලයට කිලෝ මීටරයක් පමණ දුරින් පිහිටි කටුබැද්ද නගරයට ගොස් එහි තිබූ ආපනශාලාවකින් මධුවිතකින්ද සප්පායම්වී රාත්‍රී ආහාරයද ගෙන නිදාගැනීම සඳහා නැවත ආපසු නවාතැන වෙත පයින්ම පැමිණියෙමු. එම වකවානුවෙහි දිගින් දිගටම රාත්‍රී නිරීක්ෂණ සිදුකළ යුතුවූ බැවින් රාත්‍රියක විවේක ගැනීමට ලැබීම කලාතුරකින් ලැබෙන අවස්ථාවකි.

අපගේ ත්‍රිකෝණමිතික ස්ථානයේ පිහිටීම අනුව මොරටුව විශ්ව විද්‍යාලය වෙත පයින් පැමිණීමේදී විශ්ව විද්‍යාලයට ආසන්න වනවිට හමුවන කන්ද නගින විට අප විසින් සවිකළ බීකනය දර්ශණය විය යුතුය. එහෙත් එය පෙනෙන්නට නැත. මුලින් අප සිතුවේ ඒ වන විට අප සිටි සිහි මඳ තත්ත්වය අනුව එය නොපෙනෙන බවයි. හොඳින් ඇස් පිසදා බැලුවත් එය දර්ශනය නොවේ. ඉක්මන් කර එම ස්ථානයට ගියවිට දක්නට ලැබුනේ විදුලි බීකනය සහිත අට්ටාලය පැත්තකට ඇලවී ඇති බවය. පියවි සිහිය ලැබීමට එයම ප්‍රමාණවත් විය. රාත්‍රියේ අඳුරේ ටෝච් එළියෙන් නැවත විකෝණමාන දෙක සවිකර, ලණු සීරුමාරු කර බීකනය කෙලින් කර නියමිත ස්ථානයෙහි ස්ථානගත කළෙමු. මෙවර එම කාර්යය සඳහා දහවල් මෙන් අධික කාලයක් ගත නොවුණු අතර ඒ උත්තේජනවල පිහිට නිසා විය හැකිය.

### 3.4 අධ්‍යාපන කටයුතු සහ විභාග පැවැත්වීම

එකල දියතලාව මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනයේ මැනුම් විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ආයතනයේ දේශක මහතුන්ට අමතරව එවකට සර්වේයර් ජනරාල් ඇතුළු මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ඉහලම නිලධාරීන් සියළු දෙනාම පාඨ දේශන පැවැත්වීමට පැමිණියහ. ඒ ඔවුන් විසින් විශේෂයෙන් හදාරන ලද විෂයයන් සම්බන්ධයෙනි. අද මෙන් නොව එකල දෙපාර්තමේන්තුවේ ඉහලම නිලධාරියා පවා තම විෂය සම්බන්ධයෙන් යාවත්කාලීනව සිටි බවටත් සාමාන්‍ය රාජකාරි වල නියුක්තව සිටිමින් දියතලාවට ගොස් දේශන පැවැත්වීමට අවශ්‍ය කාලවේලාව සොයාගැනීමට සහ මානසික ඒකාග්‍රතාවය පවත්වාගැනීමට හැකි රාජකාරි පරිසරයක් තිබුණු බවටත් එය සාක්ෂි දරයි. එමඟින් යම් යම් විෂයයන් සම්බන්ධව විශේෂඥයින්ගේ දැනුම ලබාගැනීමට අපට අවස්ථාව ලැබුණි. දක්ෂ ගුරුවරුන්ද වූ ඔවුන් ඉගැන්වීමට ප්‍රිය කළහ.

විවිධ සමීකරණ ඇතුලත් එක් අමාරු විෂයයක විභාග ප්‍රශ්න පත්‍රයට පෙනීසිටීමට පෙර උගැන්වූ ගුරුවරයාගෙන් අප ඉල්ලා සිටියේ එම විෂයේ කරුණු වටහා ගැනිමට මෙන්ම මතක තබාගැනීමට අපහසු බැවින් විවෘත සටහන් (Open Notes) විභාගයක් පවත්වන ලෙසය. එම ඉල්ලීමට සාර්ථක ප්‍රතිචාරයක් දක්වමින් අවශ්‍ය සටහන් එක් ෆුල්ස්කැප් කොලයක ලියා විභාග ශාලාවට රැගෙන යාමට අවසර ලැබිණ. අප සැම දෙනා විෂය පිළිබඳ ලියූ පොත් පරිශීලනය කරමින් ඒවායේ සඳහන් කරුණු විශාල පරිශ්‍රමයක් දරා කිහිප වරක් සංක්ෂිප්ත කිරීමෙන් පසු විභාගයට පෙරදින වනවිට ඉතා කුඩා අකුරු වලින් කඩදාසියේ දෙපැත්තම පිරෙන්නම ලියූ ෆුල්ස්කැප් කොලයක් සකස්කර ගැනීමට හැකිවිය. විභාගයට වාඩිවූ පසුව දැකගැනීමට ලැබුනේ අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු දීම සඳහා ලියාගෙන ආ ෆුල්ස්කැප් කොලයෙන් ගතහැකි කිසිවක් නොවන බවයි. එහෙත් ෆුල්ස්කැප් කොලයේ සංක්ෂිප්තව සටහන් යෙදීම සඳහා කිහිප වරක්ම පරිශීලනය කිරීමට සිදුවූ කරුණු ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් විය.

විභාගයකදී සාමාන්‍ය පිළිවෙල වන්නේ පිළිතුරු පත්‍ර එකතු කරගෙන ගොස් විභාග පරීක්ෂක විසින් ලකුණු යෙදීමයි. එහෙත් මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනයේ මැනුම් විද්‍යාව

පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා පැවැත්වූ එක් විභාගයකදී විභාගය අවසානයේදී පිළිතුරු පත්‍ර විභාග අපේක්ෂකයින් අතර හුවමාරු කර ලකුණු ලබාදීමේ ක්‍රමයක් හඳුන්වාදීමට එක් දේශක වරයෙකු වරෙක පියවර ගත්තේය. එය ඉතා හොඳ ක්‍රමයකි. සාමාන්‍යයෙන් විභාගයකදී විභාග අපේක්ෂකයින් ගෙන් සියළුම ප්‍රශ්න වලට පිළිතුරු බලාපොරොත්තු නොවන බැවින් පිළිතුරු දීම සඳහා ඔවුන් විසින් තෝරා ගනු ලබන්නේ තමන් පිළිතුරු දන්නා ප්‍රශ්ණ පමණක් වේ. මෙම ක්‍රමය මඟින් පිළිතුරු දුන් සහ නොදුන් සියළුම ප්‍රශ්න වලට පිළිතුරු දැනගැනීමට සැමදෙනාටම හැකිවන අතර උත්තර වලට ලකුණු ලබාදෙන ක්‍රමයද විනිවිදභාවයෙන් යුක්ත බැවින් විභාගය පිළිබඳ විශ්වාසයද තහවුරු වේ.

සාමාන්‍යයෙන් උසස් අධ්‍යාපන ආයතනයක දේශන ශාලාවක නොපවතින ගුණාංග මැනුම් හා සිතියම් ගතකිරීමේ ආයතනයේ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වූ දේශන ශාලාවල දක්නට ලැබුණි. පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් පැමිණි මහාචාර්යවරයෙකු දේශනය පවත්වන අතරතුර දේශන ශාලාවේදී දුම් පානය කිරීම එවැන්නකි. ඉතා දක්ෂ පළපුරුදු දේශකයෙකු වූ ඔහු සමහර විටෙක දේශනය අතරතුර දුම්වැටියක් පත්තු කිරීමෙන් පසුව තවත් එක උගුරක්වත් නොබී දුම්වැටිය පිලිස්සී අවසන්වූ පසුව ෆිල්ටරය ඉවතට විසිකළ අවස්ථා දැක ඇත. ඒ දුම්වැටිය අත තබාගෙන දේශනය නොනවත්වා සිදුකරන බැවිනි. අතද පිලිස්සෙන තෙක් දුම්වැටිය පිලිස්සී ගියද, තම දේශනය ගැන මිස දුම්වැටිය දල්වාගත් බව අමතකවීමට තරම් දේශනය කෙරෙහි අවධානය යොමුකිරීම ඔහුගේ සිරිතකි.

තවත් දේශක වරයෙකුගේ අපූරු පුරුද්දක් විය. ඒ තම මුළු දේශන කාලය තුලම සුළු සේවකයෙකු ලඟ තබාගැනීමයි. ඔහුගේ රාජකාරිය වූයේ කළුලැල්ල මැකීමයි. දේශකයා උපදෙස් දුන් විගස කළු ලැල්ල මකා දේශන ශාලාවේ ඉදිරිපස සිටගෙන සිටී. ජීවිත කාලය තුල ආචාර්ය මහාචාර්ය වරුන් විශාල ප්‍රමාණයකගේ දේශන වලට සහභාගි වී ඇතත් කළු ලැල්ල මැකීමට තවත් කෙනෙකු ලඟ තබාගත් මා දුටු එකම දේශකයා ඔහු බව කිවයුතුය.

